රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government

මගේ අංකය / எனது இல / My No: ADS/PA/192
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2020.03. 26

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත,

**<u>කඩිනම් දුක්ගැනවිලි සහන සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් පිහිටුවීම.</u>**

COVID-19 නම් වූ නව කොරෝනා වෛරසය රට තුල ව්‍යාප්ත වීම හේතුවෙන් ඇති වූ හදිසි අනපේක්ෂිත තත්ත්වය මත හදිසි ක්‍රියාමාර්ගයක් ලෙස ඇඳිරිනීතිය ප්‍රකාශයට පත් කිරීම හේතුවෙන් ඇතැම් පුද්ගලයන් හා පාර්ශවයන් යම් මට්ටමකට අපහසුතාවයට පත්වීම සාමාන්‍ය තත්ත්වයකි. එහෙත් මෙම අනපේක්ෂිත අවස්ථාවේ කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව අවබෝධයක් නොමැතිවීම හා බොහෝ රජයේ කාර්යාල වසා තැබීම හේතුවෙන් හා ඇඳිරිනීති තත්ත්වය මත මහජනයාට තම ගැටළු ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත.

02. මේ පිළිබඳව අවධානය යොමු කර පහත සඳහන් පරිදි කඩිනම් දුක් ගැනවිලි සහන යාන්ත්‍රණයක් උදෙසා වන කමිටුවක් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය යටතේ පිහිටුවීමට ක්‍රියා කර ඇත. මෙහිදී පවතින අනපේක්ෂිත තත්ත්වය තුළ ජනතාව මුහුණ දෙන ගැටළු සෘජුවම අදාල සම්බන්ධීකරණ නිලධාරීන් වෙත යොමු කළ හැකි අතර ඔවුන් විසින් අවශ්‍ය හා සුදුසු පරිදි අදාල ආයතන හා රාජ්‍ය නිලධාරීන් සම්බන්ධීකරණය කර දීමට ක්‍රියා කරනු ඇත.

03. සමස්ත දිවයිනම සම්බන්ධීකරණය කරමින් දැනට ප්‍රාදේශීය ලේකම්වරුන් ප්‍රමුඛ අනෙකුත් නිලධාරින් සමඟ එක්ව දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් ඉටු කරගෙන යනු ලබන වගකීම් සහගත ක්‍රියාමාර්ග අතිශයින් අගය කරන අතර එම කර්තව්‍යය වඩාත් කාර්යක්ෂම හා සාධනීය වනු පිණිස උපරිම සහය ලබා දීම සඳහා මෙම දුක්ගැනවිලි සහන සම්බන්ධීකරණ කමිටුව ස්ථාපනය කර ඇත. එබැවින් සියලු දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු පිහිටුවීමට කටයුතු කර සම්බන්ධීකරණ කටයුතු සඳහා එක් මාණ්ඩලික නිලධාරියෙකුගේ හා සහයක නිලධාරියෙකුගේ නම් හා දුරකතන අංක 0112693546 යන ෆැක්ස් අංකය වෙත හැකි ඉක්මණින් යොමු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

දුරකථන / தொலைபேசி / Telephone: 011-2696211-13, 011-2166000
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2695279
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail: information@pubad.gov.lk
ලිපිනය / முகவரி / Address: නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකා. / சுதந்திர சதுக்கம் கொழும்பு 07, இலங்கை / Independence Square, Colombo 07, Sri Lanka
වෙබ් අඩවිය / இணையத்தளம் / Website : www.pubad.gov.lk

Scanned with CamScanner

03. සම්බන්ධීකරණ කමිටුව සඳහා පත් කර ඇති නිලධාරීන් පහත පරිදි වේ.

| නිලධාරියාගේ නම | තනතුර | ආයතනය | දුරකතන අංක |
|---|---|---|---|
| ප්‍රදීපා සේරසිංහ මිය | අතිරේක ලේකම් | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | 0760390981 |
| රවීන්ද්‍ර පත්මප්‍රිය මයා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 0712500031 |
| ගයාන් අල්ගේවත්තගේ මයා | අධ්‍යක්ෂ | ජාතික එළදායිතා ලේකම් කාර්යාලය | 0760390437 |
| බුද්ධිකා ගමගේ මිය | අතිරේක අධ්‍යක්ෂ | ජාතික එළදායිතා ලේකම් කාර්යාලය | 0766528068 |
| ජේ.ඒ.ඩී. රොෂාන් මයා | අතිරේක අධ්‍යක්ෂ | ජාතික එළදායිතා ලේකම් කාර්යාලය | 0766527589 |
| මනෝජ අමරසිංහ මයා | ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | 0760390564 |
| ජනක ප්‍රේමරත්න මයා | නියෝජ්‍ය පාලක | ආගමන හා විගමන දෙපාර්තමේන්තුව | 0760390732 |
| රුසිත ධර්මසේන මයා | අධ්‍යක්ෂ | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 0760391461 |
| බුද්ධික ජයතිස්ස මයා | අධ්‍යක්ෂ | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 0760390563 |
| අකලංකා රත්නායක මෙනවිය | සහකාර අධ්‍යක්ෂ | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 0760390752 |
| තුලක්ෂි පුවේන්ද්‍රන් මෙනවිය | සහකාර අධ්‍යක්ෂ | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 0760390754 |

එස්. හෙට්ටිආරච්චි

ලේකම්

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

Scanned with CamScanner